*ප්‍රශ්නය : අවසරයි ස්වාමින් වහන්ස, දඹුල්ල රජමහ විහාරයේ ඓතිහාසික පසුබිම පිළිබඳ විග්‍රහ කරන්න පුළුවන් ද?*

පිළිතුර : දඹුල්ල රජමහ විහාරය අද විහාරස්ථානයක් වශයෙන් ප්‍රසිද්ධියට පත් වෙලා තිබුණත් මෙහි ආරම්භය වන්නේ මෙය ආරම්භ වුයේ සංඝාරාමයක් ලෙස. දඹුල්ල රජමහා විහාරය පිහිටා තිබෙන ලෙනෙහි පූර්වභාග්මීය යුගයට අයත් වන සෙල් ලිපියක් හෙවත් කටාරම් ලිපියක් තියෙනවා. ''දෙවනපිය මහරකධශ ගමිණි තිශශ මහලෙණෙ අගත අනගත චතුදිශ ශශශ දෙනෙ'' කියලා. මෙයින් කියැවෙන්නේ '' දෙවියන්ට ප්‍රිය වු ගාමිණී තිස්ස මහ රජතුමා විසින් මේ ලෙන අවා වුත්, නාවා වුත් සතර දිසාවෙන් වඩින මහා සංඝරත්නයට පූජා කළ බව''. මෙම විහාරය පිහිට ලෙන පමණක් නොවේ තවත් ලෙන් හැත්තෑ තුනක් මේ දඹුල්ල පර්වතය ආශ්‍රිතව පිහිටා තිබෙනවා. මේ සෑම ලෙනකම කටාරම් කොටා තිබෙනවා. ඒ වගේ ම භික්ෂූන් වහන්සේලා වැඩ ඉදලා තියෙනවා. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් පසුගිය කාලයේ කළ පරීයේෂණයකින් අනාවරණය කළා මේ දඹුලු ලෙනේ තියෙන ''දෙවනපිය මහ රකධශ ගමිණි තිශශ'' කියා කියන්නේ දෙවානම් පියතිස්ස රජු පිළිබඳ කියලා. එසේ නම්ලංකාවට බුදු දහම හඳුන්වා දුන් මුල් වකවානුවේදිම එනම් ක්‍රි.පු. 3 වන සිවසේ දී දඹුලු රජමහා විහාරය සංඝාවාසයක් වශයෙන් වන වාසි භික්ෂූන් වහන්සේලාගේ වාසස්ථානයක් වශයෙන් ආරම්භ වු බව අපට සලකන්නට වෙනවා. ඊට පසුව වළගම්බා රජ සමයේ එනම් ක්‍රි.පු. 1 වන සියවසේ) මෙය විහාරස්ථානයක්, ප්‍රතිමා ගෘහයක් බවට පත් වෙලා තියෙනවා.

*ප්‍රශ්නය : ඔබ වහන්සේගේ මග පෙන්වීම යටතේ අලුත් සංකල්ප රාශියක් ආරම්භ කර තියෙනවා. ඒ අතරින් එකක් තමයි සර්ව නිකායිය සංකල්පය. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න පුළුවන් ද?*

පිළිතුර : බුදුරජාණන් වහන්සේ භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා කියලා සිව් පිරිසක් ස්ථාපිත කරලා තියෙනවා. මෙහි භික්ෂු-භික්ෂුණී කියන මේ සමාජ දෙක ස්ථාපිත කිරීමේදී අනුගමනය කළ මුලික කරුණු දෙකක් තිබෙනවා. මෙහිදි ජාති භේදය හා කුල භේදය පිළිබඳ සලකා නැහැ. එය තමයි මෙහි ඇති මුලික ලක්‍ෂණ දෙක. භික්ෂු සමාජය ගොඩ නැගිමේ දී කුල භේද සලකා නැහැ. ඕනෑම කුලයක, ඕනෑම

පුද්ගලයෙකුට, ඕනෑම රටක, ඕනෑම ජාතියකට අයිති කෙනෙකුට පැවිදි වීමේ හා උපසම්පදාව ලබා ගැනීමේ අවස්ථාව තිබුණා. භික්ෂුණී සමාජයටත් ඒ වරප්‍රසාදය ලබා දුන්නා. ස්ත්‍රී කියා ලිංග භේදයකින්, කුල භේදයකින්, ජාති භේදයෙන් තොරව ඒ අයටත් තොරව පැවිද්ද ලබා ගැනීමට අවස්ථාව ලබා දුන්නා. පසුගිය වකවානුව තුළ මේ තත්ත්වය කිසියම් ආකාරයේ වෙනෙසකට භාජනය වුණා.

ඒ නිසා මම අපේ සංඝ සභාවට අපේ සංඝ සභාවවත් කිසියම් ආකාරයක වැඩපිළිවෙලක් මේ පිළිබඳව අනුගමනය අවශ්‍ය බව යෝජනා කළා. සියලුම භේදයන්ගෙන් තොරව මේ උපසම්පදා කටයුතු නැවත වාරයක් සංඝ සමාජය තුළ ස්ථාපිත කරන්නේ කොහොමද කියලා මම කල්පනා කළා. ඒ වන කොට භික්ෂු සමාජය තුළ කුල භේදය කරන කොට ගෙන උපසම්පදාව වර්ගීකරණය වී තිබුණා. එක එක නිකාය වශයෙන්. වර්තමානයේ දී භාවිතා කරන්නේ මූලික වශයෙන් උපසම්පදාවේදී බලපෑ කුලයයි. එය තමයි පැහැදිලි යථා තත්ත්වය. එය අපි දඹුල්ලෙන් බැහැර කළා. දඹුල්ලේ උපසම්පදාව ලබා දීමේදී ඕනෑම නිකායක, කුලය, පාර්ශවයක ස්වාමින්වහන්සේ නමක් විනයානුකූලව සුදුසුකම් ලබා සිටිවානම් ඒ ස්වාමින් වහන්සේට උපසම්පදාව ලබා ගැනීමට 1985 වර්ෂයේ සිට අවශ්‍ය කටයුතු අප සලසා දී තිබෙනවා. ඒ වගේම උන්වහන්සේ දැන උගත යුතු බණ දහම් ඉගෙන ගැනීම අනිවාර්යය කර තිබෙනවා. ඒ සඳහා ලිඛිත හා වාචික වශයෙන් ධර්ම පරීක්ෂණ දෙකක් පවත්වනවා. අපේ රටේ අවුරුදු 900 ක පමණ කාලයක් භික්ෂුණී ශාසනය නැතිව තිබුණා. භික්ෂුණීන් වහන්සේලා නොමැතිව විශාල ශාසනික අඩුපාඩුවක් තිබුණා. ඒ අඩුව අපි සම්පූර්ණ කර ගන්නේ කොහොමද කියලා අපි සාකච්ඡා කළා. ඒ අනුව බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්ම විනයට හා ථෙරවාද සම්ප්‍රදායට අනුව භික්ෂුණී ශාසනය නැවත ස්ථාපිත කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කළා. එමගින් 1998 දී දඹුල්ලේදී භික්ෂුණී උපසම්පදා විනය කර්ම සිදු කිරීම මගින් භික්ෂුණී ශාසනය නැවත දෙවෙනි වරට ශ්‍රී ලංකාවේ ආරම්භ කළා.

*ප්‍රශ්නය : මේ අලුත් අදහස් සමග ගමන යාමේ දී මොන ආකාරයේ අභියෝග සඳහා මුහුණ දීමට සිදු වුවාද?*

පිළිතුර : සාම්ප්‍රදායික මත දැරූ ඇතැමෙක් මෙය සාම්ප්‍රදායකට ගැලපෙන්නේ නැහැ කියන තර්කය ඉදිරිපත් කළා මිසක් ධර්ම විනය අනුව මේ සඳහා විරෝධතා, තර්ක ඉදිරිපත් කරන්න අපොහොසත් වුණා. බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන්නේ සංඝ සමාජය තුළ කිසියම් ධාර්මික ගැටළුවක් ඇති වූ විය ධර්මවිනයානුකූලද කියා සොයා බලන ලෙසයි. අපි සිදු කළේ මෙය ධර්මවිනයානුකූලව නිවැරදිද කියා බලන එක පමණයි. ධර්මවිනයානුකූලව මෙය නිවැරදිනම් කුමන විරෝධතා ඇති වුවත් ඉන් පලක් වන්නේ නැහැ.

*ප්‍රශ්නය : කුල බේදීමේ ඉතිහාසය කුමක්ද? ඔබ වහන්සේ සඳහන් කළ සිටියා බුදුරජාණන් වහන්සේගේ සංකල්පය තුළ මෙම කුල බේදය නොතිබූ බව. එසේනම් මේ බෙදීම ඇති වුයේ ඇයි?*

පිළිතුර : ශ්‍රී ලංකා සංඝ සමාජයේ මේ කුල වාදය පැහැදිලිවම ආරම්භ වුයේ මහනුවර යුගයෙන්. මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා රාජ්‍ය අනුග්‍රහය යටතේ ලංකාව තුළ නැවත උපසම්පදාව පිහිටුවනු ලැබුවා. මේ කාලයේ සිදුවූ එක්තරා ප්‍රසිද්ධ කථාවක් තිබෙනවා. රජතුමා මාලිගාවට පැමිණි භික්ෂූන් වහන්සේලාට වැඳගෙන යන අවස්ථාවේ එක් භික්ෂූන් වහන්සේ නමක් නැගිට 'දෙයියෝ බුදු වන්න' කියලා රජතුමාට වැද්දා කියලා සඳහන් වෙනවා. මෙම සිද්ධිය රජතුමාට ගැටළුවක් වුවා. මේ පිළිබඳ සංඝරාජ හාමුදුරුවන්ගෙන් විමසු විට 'ඒ ස්වාමින්වහන්සේ ගොවිගම කුලයේ නොවන කෙනෙක් බව' උන් වහන්සේ පවසා තිබෙනවා. එහිදී ගොවිගම කුලයේ හැර වෙන කිසිම කෙනෙක් අස්ගිරි මල්වතු මහා විහාර දෙකෙහි පැවිදි උපසම්පදා නොකරන ලෙස රජතුමා පැහැදිලිවම පවසා සිටියා. එයට හේතුව රජතුමා හින්දු සාමාජිකයෙක්. ඒ යුගයේ හින්දු සමාජය තුළ කුලවාදය ඉතා තදින්ම ක්‍රියාත්මක වුණා. සංඝ සමාජයේ ගෞරවයක් ඇති කරනු පිණිස තමන් පිළිගත් කුල වාදය සංඝ සමාජය තුළටත් ආරෝපනය කළ යුතුයි යැයි රජතුමා කල්පනා කළා විය හැකියි. රාජ නියෝගය නිසා භික්ෂූන් වහන්සේලා මෙය පිළිගත්තා විය හැකිය. අද රාජසිංහ රජතුමා නොමති නිසාත්, රාජ්‍ය යුගයක් නොවන නිසාත්, මූලික බෞද්ධ දර්ශනයට පටහැනි නියෝගයක් නිසාත් මෙය ඉවත් කළ යුතු කාලය දැන් එළැඹ තියෙනවා.

*ප්‍රශ්නය : මෙම තොරතුරු තාක්ෂණ යුගය තුළ ධර්මයට විශේෂ අවස්ථාවක් තිබෙනවා. ඒ නිසා අපිට අවස්ථාවක් තියෙනවා ලංකාවේ නැවත ධර්මදූත සේවාව ආරම්භ කරන්න. ඔබවහන්සේගේ මතය කුමක්ද?*

පිළිතුර : ජපානය, කොරියාව වැනි රටවල් වල ක්‍රියාත්මක වන්නේ මහා යාන සම්ප්‍රදාය. ලංකාව, බුරුමය, තායිලන්තය වැනි රටවල ක්‍රියාත්මක වන්නේ ථෙරවාදි සම්ප්‍රදාය. මා හිතන ආකාරයට මේ සම්ප්‍රදායයන් දෙක පිළිබඳ හරි අවබෝධයක් අපේ ජනතාවට නැහැ. බොහෝ දෙනෙක් හිතන්නේ මේ මහායාන සම්ප්‍රදාය බොහෝ භායානක, බියකරු ළඟට නොගත යුතු දෙයක් බවයි. නමුත් මහායානයත්, ථෙරවාදයත් යන දෙකම නිර්වාණය වෙත යන ගමන් මාර්ග දෙකක්. උදාහරණයක් වශයෙන් ශ්‍රීපාදස්ථානය ගනිමු. එයට යන්න මාර්ග දෙකක් තිබෙනවා. එකක් කුරුවිට පාර. අනෙක නල්ලතන්නි පාර. නල්ලතන්නි පාරෙන් ගියත්, කුරුවිට පාරෙන් ගියත් හැම දෙනාටම වන්දනා කර ගන්න ලැබෙන්නේ එකම ශ්‍රීපාදස්ථානයි. මහායානයේ හෝ ථෙරවාදයේ හෝ මූලික අරමුණ, පරමාදර්ශය නිර්වාණයයි. මාර්ග දෙකක් හඳුන්වා දී තිබෙනවා. තමන් කැමති මාර්ගයකින් කෙනෙකුට යන්න පුළුවන්. නමුත් මෙයි පිළිගැනීම මත ගොඩ නැගී ඇති සම්ප්‍රදායයන් අපේ ලංකාවේ සම්ප්‍රදායයන්ට වඩා හාත්පසින් වෙනස්. මහායාන දර්ශනයේ තිබෙන ඉගෙන් වීම් අපේ ථෙරවාදි දර්ශනයේ තිබෙන ඉගැන්වීම් වලට වඩා හාත්පසින්ම වෙනස්. ඒ නිසා මේ දෙක දර්ශනාත්මකව ගලපා ගන්න අපහසුයි. නමුත් සමාජ සේවා අතින් මේ දෙපක්ෂයම මහජන හිතසුව පිණිස මේ සම්ප්‍රදායයන් දෙකෙහිම ස්වාමින් වහන්සේලා කැපවෙනවා. ඒ නිසා සමාජ සේවා, ආගමික සේවා සම්බන්ධයෙන් කිසිම ගැටළුවක් මතු වන්නේ නැහැ. ඒ නිසා මනා සම්බන්ධීකරණයක් මේ රටවල් අතර ඇති කරගෙන ක්‍රියා කළහොත් අපට විපුල ප්‍රයෝජන ලබා ගන්න පුළුවන්. අද වන විටත් තොරතුරු තාක්ෂණය ධර්ම දූත සේවාව සඳහා යොදාගෙන තිබෙනවා. බෞද්ධ වෙබ් අඩවි රාශියක් අන්තර් ජාලයට එක්ව තිබෙනවා. එය වඩාත් ඵලදායි වූවක්.

*ප්‍රශ්නය : ඔබවහන්සේ සමාජසේවා කටයුතු රාශියක් සිදුකරනු ලබනවා. රට පුරාම බොහෝ වැඩ කොටසක් සිදු කරනවා. විශේෂයෙන් මේ ප්‍රදේශයට, දිස්ත්‍රික්කයට බොහෝ වැඩ කොටසක් සිදුකරනවා. ඒ පිළිබඳ විග්‍රහයක් කළෙත් ස්වාමින්වහන්ස?*

පිළිතුර : 'පන්සලෙන් ගමට' නමින් විශේෂ වැඩපිළිවෙලක් මම ආරම්භ කර තිබෙනවා. බොහෝ දෙනා තුළ මතයක් තිබෙනවා පන්සලේ හාමුදුරුවෝ නිතරම අනුශාසනා කරන්නේ පන්සලට යමක් ගන්න පමණයි, ගමට කිසි දෙයක් දෙන්න අදහසක් නැහැ කියලා. ඒ නිසා මට අවශ්‍ය වුනා මේ සංකල්පය අනෙක් පැත්තට හරවා ගන්න. ගමෙන් පන්සලට නොවෙයි. පන්සලෙන් ගමට යම් දෙයක් දෙන වැඩ පිළිවෙලක් සකස් කරන්න. බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා කුසගින්නේ සිටින අයට ධර්මදේශනා පවත්වන්න එපා කියලා. බඩ පිරුණු කෙනෙකුට තමයි ධර්ම දේශනා කරන්න අවශ්‍ය. බඩ පිරුණු, සමෘද්ධිමත් කෙනෙකුට ධර්මය අවබෝධ කර ගන්න බොහෝම පහසුයි. අපේ රටේ අද තිබෙන ප්‍රධානතම කාරණය වන්නේ දරිද්‍රතාවය. දඹුල්ල වැනි ප්‍රදේශයක බොහෝමයක් සිටින්නේ කෘෂි කාර්මික ජිවන ක්‍රමයක් අශ්‍රිතව ජිවත් වන ජනතාවක්. ඒ නිසා පන්සලෙන් සිදුවන අධ්‍යාත්මික සේවාවට අතිරේකව ඔවුන්ගේ ආර්ථිකය නගා සිටුවීමේ ක්‍රියාදාමයකට දායක වෙන්න අවශ්‍යයි කියන අදහස අනුව 'පන්සලෙන් ගමට' යන වැඩසටහන ආරම්භ කරනු ලැබුවා. කෘෂි කාර්මික පැත්ත අලලා 1988 දී 'කණ්ඩලම වම්ඇල 02 වෙනි පියවර' නමින් ගොවි සංවිධානයක් පිහිටුවා ගත්තා. එම ගොවි සංවිධානය යටතේ අක්කර 800 ක් පමණ විශාල කුඹුරු යායක් අස්වැද්දුවා. එහි බොහෝ ජල ප්‍රශ්න තිබුණා. ඇළ වේලි පද්ධති සකස් කරලා ඒවාට විසදුම් ලබා ගත්තා. එදා සිට අද දක්වා එහි සභාපතිවරයා වශයෙන් මම කටයුතු කරනවා. අද වන විට සාමාජිකයන් 413 දෙනකු සිටිනවා. අද වන විට එම ගොවි සංවිධානය යටතේ, මාගේ නායකත්වය යටතේ එම ගොවීන්ට හොඳ කෘෂි නිෂ්පාදයක්, හොඳ ආදායමක් ලබා ගන්න නායකත්වය, මඟ පෙන්වීම ලබා දී තිබෙනවා. වැලමිටියාව ප්‍රදේශයෙත් 'ශ්‍රී සුමංගල එක්සත් ගොවි සංවිධානය' තවත් ගොවි සංවිධානයක් තිබෙනවා. අක්කර 600 ක් පමණ වු එහිත් සමාජිකයන් 218 ක් පමණ සිටිනවා. එම සංවිධනයේත් සභාපති වශයෙන් මම කටයුතු කරනවා. මාගේ නායකත්වය තුළින් එම ගොවීන් කිසියම් දර්ශනයක් ඇතිව, හික්මීමකින් යුක්තව ඵලදායි කෘෂි කර්මයකට යොමු කර තිබෙනවා. ඒ වාගේම විද්‍යාත්මක කෘෂි කර්මය පිළිබඳ පුහුණු වැඩසැසි පවත්වනවා. මෙමගින් ප්‍රදේශයේ කෘෂි කාර්මික ජීවිතයක් ගත කරන ජනතාව ශක්තිමත් කරන්න පන්සල දායක වෙනවා. ප්‍රදේශය තුළ පාසල් හැර ගිය, රැකියා විරහිත තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවක් සිටියා. මම මේ අය වෙනුවෙන් 1995 වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පන්සල තුළ ආරම්භ කරනු ලැබුවා. වරකට ශිෂ්‍ය ශිෂ්‍යාවක් 200 බැගින් ගෙන ඔවුන්ට වෘත්තීය පුහුණුව ලබා දෙනවා. පරිගණක, මුද්‍රණ, ලී කැටයම්, විදුලි ස්ථාපන, රේඩියෝ

ඉලෙක්ට්‍රෝනික් වැනි ක්ෂේත්‍රයන් සය මාසික පුහුණුවක් ලබා දෙනවා. ඒ තුලින් වාර්ෂිකව 400 දෙනෙකුට පුහුණුව ලබා දෙනවා. ඒ රැකියා විරහිත තරුණ තරුණියන්ට දෙපයින් නැගී සිටින්න ශක්තියක් පන්සල තුළින් ලබා දෙන්න හැකි වී තිබෙනවා. විහාරස්ථානයේ පුණ්‍යාධාර අරමුදලින් ප්‍රදේශයේ අඩු ආදායම් ඇති පවුල්වල දරුවන් 300 කට උසස් අධ්‍යාපනය සඳහා මාසිකව උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව යටතේ මුල්‍ය ආධාර ලබා දෙනවා. මේ ප්‍රදේශය තුළ බොහෝ කලාකරුවන් සිටිනවා. දඹුල්ලේ වාර්ෂිකව පෙරහැරක් පවත්වනවා. මේ පෙරහැර සඳහා කලාකරුවන් සහභාගි වෙනවා. නමුත් ඒ අයට පෙරහැරට එන්න කියා කියනවා මිසක් ඒ අය පිළිබඳ කිසිම කෙනෙක් සොයා බලන්නේ නැහැ. මම එම කලාකරුවන් සියලු දෙනාම එකතු කර කලාකරුවන්ගේ සංසදයක් නිර්මාණය කළා. ඔවුන්ගේ කලායතන වල අඩුපාඩු මොනවාද කියා සොයා බලා ඒ කලායතන ශක්තිමත් කරන්න ඒ අයට ආර්ථික හා වෙනත් ආකාරයෙන් ලබාදිය හැකි සියලු සහයෝගයන් අපි ලබා දී තිබෙනවා. දහම් පාසල්, පෙර පාසල් වැනි අයතනය පවත්වාගෙන යනවා. මේ ප්‍රදේශයේ තිබෙන මරණාධාර සමිති, වෙළඳ සංගම් ආදියේත් අනුශාසකවරයා වශයෙන් මම කටයුතු කරනවා. ඒවාගේ පන්සලෙන් ප්‍රදේශයට ලබා දිය හැකි දායකත්වය ලබා දෙනවා.

*ප්‍රශ්නය : අපේ ඉතිහාසය දෙස බැලූ විට ඒ තුළ වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි අතර හොඳ සම්බන්ධතාවයක් තිබුණා. නමුත් අද අපි එයින් ඈත් වෙලා. ඒ නිසා අපේ තරුණ තරුණියන් ද අපේ සංස්කෘතියෙන් ඈත් වෙනවා. ඔබවහන්සේගේ අත්දැකීම් අනුව අද යුගයට ගැලපෙන ක්‍රමය කුමක්ද? ඒ සම්ප්‍රදාය අපට මේ යුගයට රැගෙන එන්න පුළුවන් කොහොමද?*

පිළිතුර : මම දකින ආකාරයට ගමයි පන්සලයි එකතු කර ගන්න අපිට ප්‍රයෝගිකව අපහසුතාවයක් නැහැ. අපි පන්සල මුල් කර ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල යටතේ ගමයි පන්සලයි අද වන විට බොහෝ සමීප වෙලා තිබෙනවා. අපි දඹුලු වැඩපිළිවෙල මුල් කොට මෙවැනි වැඩපිළිවෙලක් ආරම්භ කළත්, ලංකාවේ හැම පන්සලකටම මෙවැනි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න නොහැකි වෙන්න පුළුවන්. නමුත් උන්වහන්සේලාත් කිසියම් ආකාරයක වෙනත් ක්‍රම උපායක් ඒ සඳහා සකස් කර ගත යුතුයි. එම ගමේ, ප්‍රදේශයේ සම්පත් ප්‍රයෝජනයට ගනිමින්, ගමට ගැලපෙන සරල

ක්‍රමයක් අනුගමනය කරනවානම්, මෙය වඩා සංවේදීව ගම ගැන හිතවානම් පන්සලෙන් ගම කිසිවිටෙක ඈත් වෙන්නේ නැහැ කියා මම විශ්වාස කරනවා.

*ප්‍රශ්නය : ඉන්දියානුවා ඉන්දියාව ගැන ආඩම්බරයි. ජපන් ජාතිකයාත් ඒවගෙමයි. නමුත් අපිට ඒ වගේ හැඟීමක් නැහැ කියන බව ඔබ වහන්සේ සඳහන් කර සිටියා. එයට හේතුව කුමක්ද?*

පිළිතුර : මම දකින ආකාරයට එයට ප්‍රධානතම හේතුව අපේ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන වැරැද්ද. ජපානය වැනි රට වල ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම යොමු කර තිබෙන්නේ ළමයින්ගේ සාරධර්ම නගාසිටුවන්න සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීමට. කුසලතා වර්ධනය කර ගනිමින්ම, ඒ ළමයින්ට සාරධර්ම අධ්‍යාපනයත් කුඩා කළ සිටම ලබා දෙනවා. ආචාර සමාචාර කරන ආකාරය, වැඩිහිටියන්ට ගරු කරන ආකාරය, බස්නැවතුම්පලක, දුම්රිය ස්ථානයක හැසිරෙන ආකාරය, ගරු කළ යුත්තන්ට ගරු කළයුතු ආකාරය, පොදු දේපල ආරක්‍ෂා කර ගැනීමේ වැදගත්කම ආදිය ඔවුන්ට කුඩා කළ සිටම කියා දෙනවා.  මේ ආකාරයේ හැඟීම් කුඩා කල දරුවාගේ මනසට ඇතුල් කළ විට ඒ දරුවා ලොකු මහත් වුන විට එය නිරායාසයෙන්ම අනුගමනය කරනවා. නමුත් අපේ පාසල් පද්ධතිය තුළ මෙය නැහැ. ළමයා පාසලට ඇතුළු වූ විගසම ඒ ළමයාට විෂය බද්ධ කරුණු උගන්වන්න උත්සාහ කරනවා විනා, ඒ ළමයාට සාරධර්ම පැත්ත උගන්නවන්න එතරම් උනන්දුවක් දක්වන්නේ නැහැ. මෙය විශාල අඩුපාඩුවක්. ජපානයේ කෙනෙකුගෙන් ඇසුවොත් ‘ඔබ වඩාත්ම ආදරය කරන්නේ කාටද?’ කියා ඔහු කියන්නේ ‘රටට’ කියලා. දෙවනුව තමන්ගේ රැකියාවට සහ රැකියා ස්ථානයට. තුන්වෙනුව තමයි තමන්ට සහ තමන්ගේ දරුවන්ට කියලා ඔහු ප්‍රකාශ කර සිටින්නේ. රටක් තිබුණොත් තමයි රැකියාවක් තිබෙන්නේ. රැකියාවක් තිබුණොත් තමයි පවුලක් තිබෙන්නේ. අපේ සමාජය තුළ එහෙම එකක් නැහැ.

*ප්‍රශ්නය : අපේ අධ්‍යාපන ක්‍රමය වෙනස් කරනවානම් එය කොතැනින්ද පටන් ගත යුතු වන්නේ?*

පිළිතුර : එය අනිවාර්යයෙන්ම පටන් ගත යුතු වන්නේ ප්‍රාථමික අධ්‍යාපනයෙන්. ප්‍රාථමික අධ්‍යාපනයේ විෂය බද්ධ කරුණු වලට නොවෙයි අපි මුල් තැන ලබා දිය යුතු වන්නේ.

අපි සාරධර්ම වලට හා කුසලතා වලට  මුල් තැන ලබා දිය යුතුයි. කුඩා ළමයා රුචි කරන්නේ කුමක්ද කියා ප්‍රාථමික අවධියේදීම අපි හැදින ගත යුතුයි. කුඩා ළමයාට කඩදාසි, ලී කැබලි ටිකක් ලබා දුන් විට ඔහු හදන්නේ කුමක් යන්න තුළින් දැනගත හැකි වෙනවා ඔහුගේ රුචිකත්වය, මානසිකත්වය කුමන ආකාරයද කියා. ඒ ආකාරයේ ළමයින් හඳුනා ගැනීමේ කුසලතා පූර්ණ අධ්‍යාපනයක් අපි ප්‍රාථමික අවධියේ ලබා දිය යුතුයි.

*ප්‍රශ්නය : අධ්‍යාපනය ක්‍රමය වෙනස් කිරීමට අමතරව තව කළ යුතු වන්නේ කුමක්ද?*

පිළිතුර : මෙය අවුරුදු ගණනාවක් කළ යුතුයි. දැන් ඉන්න පරපුරට ක්ෂණිකව මෙය කරන්න නම් මාධ්‍ය හරහා කිසියම් ආකාරයක වැඩපිළිවෙලක් තුලින් අපේ ජනතාව දැනුවත් කළ යුතුයි. දේශපාලන හෝ කුමන ආකාරයෙන් බැලුවත් අපේ රටේ ජාතික නායකත්වයක් ගොඩ නැගෙන්න අවශ්‍යයි. අපේ රටේ තිබෙන්නේ පක්ෂ නායකත්වයන්. ඒ පක්ෂ නායකත්වයන් අභිබවා ගිය ජාතික නායකත්වයක් ගොඩ නැගීම අද අත්‍යාවශ්‍ය දෙයක්.

*ප්‍රශ්නය : අපි හැම දෙයක්ම බලන්නේ පටු විදියට. හැම පැත්තේම සොයන්නේ නොයෙක් ආකාරයේ බෙදීම්. සමගියක් පිළිබඳ අපි කතා කරන්නේ නහැ. එයට හේතුව කුමක්ද?*

පිළිතුර : අපේ තිබෙන පොකුම දුර්වලකම එය තමයි. අද තිබෙන රටාව අනුව හැම දෙනාම කිසියම් ක්ෂේත්‍රයකට කොටු වී, එය ශක්තිමත් කිරීමට, එය බලවත් කිරීමට උත්සාහ කරනවා මිසක් අපි සමස්ථයක් වශයෙන් නැගිටින්න අවශ්‍යයි කියා හෝ රටක් වශයෙන්, ජාතික වශයෙන් අපි සියලු දෙනාම නැගිටින්න අවශ්‍යයි කියන අදහසක් බොහෝ දෙනෙක් තුළ නැහැ.

*ප්‍රශ්නය : අවුරුදු හාරසියයක, පන්සියය යටත් විජිත යුගයේදී අපේ පිට කොන්ද කැඩුනා. ඒ නිසා අපි එසේ කරන්න බැහැ කියා සමහරු ප්‍රකාශ කරනවා. මෙයට හේතුය එයද? නැතිනම් වෙනත් දෙයක්ද?*

පිළිතුර : මා දකින ආකාරයට මෙයට මූලික හේතුව දුප්පත්කම. සංවර්ධිත රට වල මේ කාරණය, ප්‍රවනතාවය දකින්න නැහැ. සංවර්ධිත රටවල් මානව අයිතිවාසිකම්, පාරිසරික අයිතිවාසිකම් පිළිබඳ කතා කරන්නේ අනෙක් පැති වලින් ඔවුන් ශක්තිමත් නිසා. ලංකාවේතිබෙන දුප්පත්කම පදනම් කර බොහෝ දෙනා රට ගැන බලන්න පෙළඹෙන්නේ නැහැ. එහෙමත් කණ්ඩායමක් පමණයි රට ගැන සිතන්න උත්සාහ කරන්නේ.

*ප්‍රශ්නය : ඔබ වහන්සේ පරිසරය පිළිබඳ බොහෝ සේ උනන්දු වෙලා තිබෙනවා. පරිසරය පිළිබඳ කතා කරන විට සංචාරක ව්‍යාපාරය ගැනත් විවිධ මත තිබුණා. විශේෂයෙන් කණ්ඩලම හෝටලය නිර්මාණය කරන විට ඒ පිළිබඳ විවිධ මත තිබුණා. දැන් තත්ත්වය කෙසේද? සංචාරයක ව්‍යාපාරය අපට අවස්ථාවක්? නැතිනම් අභියෝගයක්ද?*

පිළිතුර : සංචාරක ව්‍යාපාරයට මා විරුද්ධ නැහැ. සංචාරක ව්‍යාපාරය රටට අත්‍යාවශ්‍ය දෙයක්. සංචාරක ව්‍යාපරය දියුණු කරන්න ලෝකයේ විවිධ හොඳ ක්‍රම වේදයන් අනුගමනය කරනවා. ඒ ක්‍රම වේදයන් අනුගමනය කරන්නේ ඒ රටේ ආර්ථිකයට හා සංස්කෘතියට බලපෑම් ඇති නොවන ආකාරයෙන්. ජපානය ඒ අයගේ ආර්ථිකයත්, සංස්කෘතියත් රැකගෙන තමයි සංචාරක ව්‍යාපාරය සිදුකරනු ලබන්නේ. සංචාරක ව්‍යාපරය වෙනමම ආර්ථික ක්‍රමයක්. තව ආර්ථිකයක් බිඳ හෙලමින් වෙනත් ආර්ථිකයක් ගොඩ නගනවානම් එය ඥාණවන්ත පියවරක් නෙමෙයි. කණ්ඩලම හෝටලය ගොඩනැගීමේදී අපි විරුද්ධ වුයේ රජයේ නීති රීති වලටද පටහැනිව කණ්ඩලම වැවේ එය නිර්මාණය කළ නිසා. කණ්ඩලම වැව කියන්නේ අපේ කෘෂි ආර්ථිකය. සංචාරක හෝටලය කියන්නේ සංචාරක ආර්ථිකය. වැව විනාශ කර එහි හෝටලයක් ඉදිකිරීම ඥාණවන්ත නැහැ. ලෝකයේ බොහෝ රටවල් සංචාරක හෝටල් ඉදි කළ යුතු ස්ථාන මොනවාද කියා රජය විසින් හඳුනා ගන්නවා. ඉන්පසු ඒ ස්ථාන වල හෝටල් ස්ථාපිත කරනවා. එවිට සංස්කෘතික ගැටුම් ඇති වෙන්නේ නැහැ. අනෙකුත් ආර්ථික ප්‍රශ්න වලට එය බලපෑමක් කරන්නේ නැහැ. මෙවැනි සැලැස්මක් අපේ රටට අවශ්‍යයි.

*ප්‍රශ්න : ආගමික සිද්ධස්ථානත් සංචාරක ව්‍යාපරය සඳහා යොදා ගන්නවා. එතැනින් ද නොයෙක් ආකාරයේ අභියෝග මතු වන්න පුළුවන්. ඔබවහන්සේ එවැනි අභියෝග වලට මුහුණ පා සිටිනවාද?*

පිළිතුර : අපිට ලොකු අභියෝග වලට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරය තුළින් එක් පැත්තකින් රටට ආර්ථික ප්‍රතිලාභ ලැබෙන නමුත් ආගමික වශයෙන් ඒ ස්ථාන වලට බොහෝ කරදර, හිරිහැර ඇති වෙනවා. සමහර සංචාරකයන් මේ ස්ථාන වල ඇති පූජනීයත්වය පිළිබඳ දන්නේ නැහැ. දඹුල්ලේ රජමහා විහාරස්ථානයේ බුදු පිළිමයක් මත විදේශීය කාන්තාවක් වාඩි වී සිටින ඡායා රූපයක් පසුගිය දින වලට පුවත්පත් වල පල වුනා. ඒ ඡායා රූපය ගන්න ඒ කාන්තාව පෙළඹුනේ ඇයි? නැතිනම් ඒ ඡායා රූපය ගන්නා තුරු මාර්ගෝපදේශකයා නිහඬව සිටියේ ඇයි? ඒ ඡායා රූපය ගත් ශිල්පියා ලංකාවේ කෙනෙක්ද? මේවා සැලසුම් කර කළ දෙයක්ද? නැතිනම් නොදැනුවත් කම නිසා කළාද? කියා ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. සජීවී ආගමික ස්ථානයකට පැමිණෙන විට සමහර විදේශිකයන්ගේ ඇඳුම් පැලඳුම් පිළිබඳ නොයෙක් ප්‍රශ්න තිබෙනවා. දඹුල්ල රජමහා විහාරස්ථානය බෞද්ධයන් විසින් වැඳුම් පිඳුම් කරන සජීවී ආගමික ස්ථානයක් මිසක් කෞතුකාගාරයක් නොවෙයි. සිගිරියට ගොස් දඹුල්ලට පැමිණෙන කෙනාට සිගිරියේ ගත කල මානසිකත්වයෙන් දඹුල්ලට එන්න බැහැ. දඹුල්ලට පැමිණෙන විට මෙය බෞද්ධයන් විසින් වැඳුම් පිඳුම් කරන සජීවී ආගමික ස්ථානයක්ය යන හැඟීමෙන් පැමිණිය යුතුයි.

*ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, වෙනත් රට වල මේ ආකාරයේ සිද්ධස්ථානයකට යෑමට පෙර උපදෙස් ලබා දෙනවා. තායිලන්තය, ජපානය වැනි බොහෝ රටවල වල මෙය සිදු කරනවා. අපට එවැනි ක්‍රමයක් සුදානම් කරන්න හැකියාව නැද්ද?*

පිළිතුර : සංචාරක ව්‍යාපාරය යටතේ මාර්ගෝපදේශන සේවයක් තිබෙනවා. ඒ අයට පුහුණුවක් ලබා දී ඒ සඳහා සංචාරක මණ්ඩලයෙන් බලපත්‍රයක් ලබා දෙනවා. නමුත් ඒ ලබා දී තිබෙන පුහුණුව ප්‍රමාණවත් නැහැ. ඒ අය සංචාරකයන්ට නිසි ආකාරයෙන් උපදෙස් ලබා දෙන්නේ නැහැ. ඒ නිසි ආකාරයෙන් උපදෙස් ලබා දෙන අය සිටිනවානම් එසේ සිටින්නේ බොහෝ අතලොස්සයි. සංචාරකයන්ට කැමති දෙයක් කිරීමට ඉඩ දී බොහෝ දෙනා නිහඬව සිටිනවා. ඒ ආකාරයෙන් වගකීමෙන් තොරව කටයුතු කරන

බොහෝ අය බෞද්ධයන් නොවෙයි. බෞද්ධ පරිසරයක හැසිරිය යුතු ආකාරය සංචාරකයන් කියා දෙන්න ඔවුන් දන්නේ නැහැ. නමුත් එය නිදහසට කරුණු ලෙස පෙන්වා දෙන්න බැහැ. ඔවුන් කරන්නේ ජාතික මට්ටමේ රාජකාරියක්. ඔවුන් මාර්ගෝපදේශකයෙක් ලෙස සේවය කරනවානම් ඔහු හැම සංස්කෘතියක් පිළිබඳවම හැදෑරිය යුතුයි. ඒ සියල්ල පිළිබඳ හදාරා අවසන් කොට එම රාජකාරිය සඳහා යෑම අවශ්‍යයි. එහෙම නැතිව 'මම බෞද්ධ නොමෙයි. ඒ නිසා මම බෞද්ධ සිරිත් විරිත් දන්නේ නැහැ' කියා කිසිම කෙනෙකුට ගැලවී යන්න බැහැ.

*ප්‍රශ්නය : ඒ පිළිබඳ ක්‍රමවත් පුහුණුවක් අපි ලබා දිය යුතුයි. ජපානයේ ආගමික සිද්ධස්ථානය වෙත යෑමට පෙර එහි හැසිරිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් ලබා දෙනවා. ඒ වගේම ජපානයේ රජ පවුල මුණ ගැසීමට යන විටත් උපදෙස් ලබා දෙනවා. පිටතින් පැමිණෙන පුද්ගලයෙකුට උපදෙස් ලබා දෙන ආකාරය ඔවුන් දන්නවා.*

පිළිතුර : අපටත් මෙය කළ හැකියි. ඒ පිළිබඳ වුවමනාවක් නොමැති කමයි අපට තියෙන්නේ.

*ප්‍රශ්නය : ස්වාමින්වහන්ස, ඔබවහන්සේ අද තිබෙන සමාජයේ යම් එක වෙනස් විය යුතුයි කියා ප්‍රර්ථනා කළහොත් එය කුමක්ද?*

පිළිතුර : අපේ ආකල්ප වල විශාල පරිවර්තනයක් සිදුවිය යුතුයි. මේ රට අපි සියලු දෙනාගේම රට කියන හැඟීම ඇති කර ගත යුතුයි. මේ රටේ පොදු සම්පත් අපි සියලු දෙනාගේම සම්පත් කියන හැඟීම තිබිය යුතුයි. ඒවාගේම සියලු ජාතීන් හා ආගමිකයන් අතර සමඟිය තිබිය යුතුයි. අපේ අතීතය තුළ එය තිබී තිබෙනවා. එය මෑත භාගයේදී නැති වී තිබෙනවා. මේවා නැතිව කිසිදාක රටක්, සමාජයක් වශයෙන් ගොඩගන්න හැකියාවක් නැහැ. ඒ නිසා ජාතික, ආගමික වශයෙන් සමඟිව කටයුතු කළයුතුයි. එසේම දේශපාලනික වශයෙන් පක්ෂ අතරත් කිසියම් සම්මුතියකට එළැඹීමේ හැකියාව තිබිය යුතුයි. ජාතික මට්ටමේ යම්කිසි කාර්යයකදී තමන්ගේ පක්ෂය ගැන නොතකා ජාතික මට්ටමෙන් ඒ ගැන බලා කටයුතු කිරීමේ හැකියා සියලුම දේශපාලන නායක නායිකාවන්ට ඇති විය යුතුයි. මේවාගේ තත්ත්වයක් අපේ රටේ ඇති වූ දවසට අපේ රටේ දියුණුව පිළිබඳ කිසියම් ආකාරයේ පෙර නිමිත්තක් ඇති වෙයි.

*බොහෝ ස්තූතියි ස්වාමින්වහන්ස.*